දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை
District Secretariat - Hambantota

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, ருஹுணு மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை. 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota


"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"சௌபாக்கியமான எதிர்காலத்திற்காக"
" For a prosperous future "

මගේ අංකය / எனது இலக்கம் / My No } DSH/ACC/13/5/5

ඔබේ අංකය / உமது இலக்கம் / Your No }

දිනය / திகதி / Date } 2026.06.15

ප්‍රධාන ලේකම්, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, ගාල්ල
දිස්ත්‍රික් ලේකම් , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර / ගාල්ල
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, හම්බන්තොට දිස්ත්‍රික්කය
පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, හම්බන්තොට
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය, තංගල්ල
සහකර අධ්‍යක්ෂ, දකුණු කලාප කාර්යාලය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ලුණුගම්වෙහෙර

**<u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026 - දෙවන අදියර</u>**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2026 වර්ෂයේ II අදියර යටතේ භාණ්ඩ, වැඩ (කොන්ත්‍රාත්) සහ උපදේශනාත්මක නොවන සේවා සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම ප්‍රසම්පාදන මාර්ගොපදේශයයේ 3.1.5 අ iii අනුව සිදු කිරීමට තීරණය කරන ලදි.

02. ඒ අනුව මේ වන විටත් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි නොවූ සහ ඊට කැමැත්තක් දක්වන සැපයුම්කරුවන් වෙතින් 2026.06.15 දින සිට 2026.07.15 දක්වා අයදුම්පත් කැඳවනු ලබන අතර, ඒ සඳහා පහත කොන්දේසි සපුරන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලැබේ.

I. අයිතම අංක 01 සිට 03 දක්වා CIDA වලංගු ලියාපදිංචිය සහිත ආයතනයක් විය යුතුවේ.

II. අයදුම් කරනු ලබන අයිතමට අදාළව පිළිගත හැකි ව්‍යාපාරනාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හෝ සමාගම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

III. අයදුම්කරනු ලබන සෑම අයිතමයක් සඳහා මුදලින් රු. 750.00 ක ආපසු නොගෙවන තැන්පතුවක් "හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්" නමින් තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ගෙවීම් සිදු කර ලබාගත් රිසිට්පතක් හෝ Govpay ගෙවීමක් යටතේ ලබා ගත් රිසිට් පතක් හෝ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් නමින් ලබා ගත් මුදල් ඇණවුමක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

IV. සම්පූර්ණ කරන ලද අයදුම්පත , මුදල් ගෙවූ රිසිට් පත හා ලියාපදිංචි ආයතනයක් බවට තහවුරු කෙරෙන ලේඛන සහිතව " දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට" ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ කුරියර් සේවාව මගින් හෝ අතින් ගෙනවිත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට බාර දිය හැක. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරෙහි " සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - II දෙවන අදියර" ලෙස සටහන් කර තිබිය යුතු වේ.

V. ලැබෙන අයදුම්පත් කමිටුවක් වෙතින් පරික්ෂා කර සුදුසුකම්ලත් සැපයුම්කරුවන් පමණක් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කරනු ලබන අතර, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර හෝ සුදුසුකම් සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ සඳහා තැන්පත් කරනු ලැබූ මුදල් ආපසු නොගෙවනු ඇත.

03. ඒ අනුව ඔබ ආයතනයේ හෝ ඔබ ආයතනය යටතේ ක්‍රියාත්මක වන අනුබද්ධිත ආයතන මගින් සැපයුම්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසත්, මේ සමඟ යොමු කරනු ලබන අයදුම්පත හා දැන්වීම අදාළ ආයතනයන් තුළ ප්‍රදර්ශනය කරවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් කාරුණිකව දැනුම් දෙමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.


කාර්යාලය / அலுவலகம் / Office } 047 2256174
ෆැක්ස් / தொலை நகல் / Fax } 047 2256235 047 2256247
දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary } 047 2256235
ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant } 047 2256246
අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மாவட்ட செயலாளர் / Additional District Secretary } 047 2256232
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning) } 047 2256234
සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant .District Secretary } 047 22
පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer } 047 22
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk
...dist.hambantota@gmail.com

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

# ආදර්ශ ඉල්ලුම් පත්‍රය

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026- II අදියර
## හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

1. සැපයුම්කරුගේ නම සහ ලිපිනය: ..............................................................................................
..............................................................................................

2. දුරකථන අංකය : ..............................................................................................

3. ඊමේල් අංකය :..............................................................................................

4. ව්‍යාපාරයේ වෙළඳ නාමය:..............................................................................................

5. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය:..............................................................................................
(ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

6. CIDA ලියාපදිංචි අංකය සහ ශ්‍රේණිය :..............................................................................................
(ඉදිකිරීම් කොන්ත්‍රාත් සැපයුම්කරුවන් සඳහා පමණි. CIDA සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

7. ලියාපදිංචියට අයදුම්කරන අයිතම අංකය සහ කරුණු:

| අයිතම අංකය | විස්තරය (අයිතමයේ සඳහන් පරිදි) | විශේෂිත කරුණු ( අයිතමයේ සඳහන් විස්තරයට විශේෂ වූ). |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

8. ව්‍යාපාරයේ ස්වභාවය :..............................................................................................
(නිෂ්පාදන/ප්‍රධාන වෙළඳ නියෝජිත/ තොග වෙළඳ නියෝජිත ද යන්න සඳහන් කරන්න)

9. ණය පදනම මත සැපයීම පිළිබඳ විස්තරය:..............................................................................................
(උපරිම ණය වටිනාකම සහ කාලසීමාව)

10. වැට් බදු අංකය:..............................................................................................

11. බැංකුකරුගේ නම සහ ලිපිනය:...............................................................................................

12. මුදල් ඇණවුම් හෝ රිසිට්පත් අංකය සහ ගෙවනු ලබන මුදල:.......................................................................

(එක් අයිතමයක් සඳහා රු. 750.00 ක් වන අතර ලදුපත ඇමිණිය යුතුය)

13. ලබා ඇති ප්‍රමිති සහතික (ISO වැනි) :.............................................................................................

14. පෙර වර්ෂවල දී මෙවැනි සේවා සපයා ඇති ආයතන හෝ මූල්‍ය වත්කම්:..................................................

(ඇමුණුම මගින් ද ඉදිරිපත් කළ හැක)

15. ව්‍යාපාර ස්ථානයට ලඟා විය හැකි මාර්ග විස්තරය:

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

16. වෙනත් වැදගත් විස්තර:.................................................................................................................

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවත්, සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ ලිපියේ සඳහන් කොන්දේසිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

දිනය: ..................................

.......................................................

සැපයුම්කරු/කොන්ත්‍රාත්කරුගේ අත්සන

(ව්‍යාපාරික මුද්‍රාව)

# දැන්වීමයි

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026 -II අදියර
## හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් 2026 වර්ෂයේ දෙවන අදියර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත. ඒ සඳහා කැමැත්තක් දන්වන සුදුසුකම් සහිත සැපයුම්කරුවන්ට 2026. ජුනි 15 දින සිට 2026 ජුලි 15 දක්වා අයදුම් කිරීමට අවස්ථාව හිමිවේ. ඒ අනුව 2026 වර්ෂයේ මේ දක්වා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ට පහත කොන්දේසි යටතේ අයදුම් කළ හැක.

01. අයදුම් කරනු ලබන සැපයුම්කරුවන් දැනට ක්ෂේත්‍රයේ නියැලෙන, ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතියක් හිමි හෝ සමාගම් ලියාපදිංචි කිරීම යටතේ ලියාපදිංචි ආයතනයක් විය යුතු වේ.
02. ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන අයිතමය වෙනුවෙන් ඊට අදාළ ආයතනික ලියාපදිංචිය තහවුරු විය යුතු අතර, අයදුම්පත්‍ර යේ වඩාත්ම සැපයීම් ලබා දිය හැකි අයිතමය සඳහන් කළ යුතුය.
03. අයදුම්පත්‍රය සම්පූර්ණ කර අත්සන හා නිලමුද්‍රව තබා තිබිය යුතු අතර ඉල්ලුම් කරනු ලබන අයිතම අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.
04. අයදුම්පත් බාර ගැනීම 2026.06.15 දින සිට 2026.07.15 දින ප.ව 2.00 දක්වා සිදු කරනු ලබන අතර, ඉන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
05. CIDA ලියාපදිංචිය අවශ්‍ය අයිතමයන් සඳහා CIDA ලියාපදිංචි ලේඛනයේ ආයතනයේ විස්තර සහිත පිටුව සහ ලියාපදිංචි C කාණ්ඩය සහිත අවසන් පිටුවෙහි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
06. ස්ථානීය පරික්ෂාවක දී සඳහන් කරනු ලබන ලිපිනයේ ස්ථානයක් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
07. එක් අයිතමයක් සඳහා රු.750.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් අයකරනු ලබන අතර, එම ගාස්තුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ගෙවීම් කර ලබාගත් රිසිට්පතක් හෝ Gavpay පහසුකම යටතේ ගෙවීම කර ලබාගත් රිසිට්පතක් හෝ "හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්" නමින් ලබාගත් මුදල් ඇණවුමක් හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවීම් කර ලබාගත් රිසිට් පතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.
08. සම්පූර්ණ කරන ලද අයදුම්පත , මුදල් ගෙවූ රිසිට් පත හා ලියාපදිංචි ආයතනයක් බවට තහවුරු කෙරෙන ලේඛන සහිතව **" දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට"** ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ කුරියර් සේවාව මගින් හෝ අතින් ගෙනවිත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට බාර දිය හැක. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරෙහි **" සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - II දෙවන අදියර"** ලෙස සටහන් කර තිබිය යුතු වේ.
09. අයදුම්පත් පරික්ෂා කිරීමේ කමිටුවක් මගින් සුදුසු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා තෝරාගැනීම සිදු කරන අතර, එම සුදුසුකම් ලත් සැපයුම්කරුවන්ගේ ලේඛනය 2026.07.31 දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් පිටුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.
10. සුදුසුකම් සපුරා නැති හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලියාපදිංචි කිරීමේ ගාස්තුව ද ආපසු ගෙවන නොලැබේ.
11. අයදුම්පත්‍රය, ලියාපදිංචි අයිතම ලයිස්තුව හා දැන්වීම් විස්තරය www.hambantota.dist.gov.lk වෙබ් පිටුවට පිවිස ලබා ගත හැකි අතර, වැඩි විස්තර සඳහා **047-2256139** හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට ඇමතීමෙන් ලබා ගත හැක.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට

**2026 වර්ෂයට භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික්කයේ දේශීය ලේකම් කාර්යාල සඳහා භාණ්ඩ( සැපයුම්) වැඩ හා උපදේශන නොවන සේවාවන් ලබා ගැනීම පිණිස 2026 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන් /දේශීය ඒජන්තවරුන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ සේවා සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වැඩ (කොන්ත්‍රාත්කරුවන්)

අයිතම අංකය. විස්තර

01. ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාව
02. මහා මාර්ග, පාලම්, බෝක්කු,වාරිමාර්ග ඉදිකිරීම හා අලුත්වැඩියාව.
    - ඉහත 01හා 02 අයිතම සඳහා CIDA හෝ පළාත් සභා ලියාපදිංචිය අනිවාර්ය වන අතර,මිලියන 02 අඩු කොන්ත්‍රාත් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ලියාපදිංචි ප්‍රජාපාදක සමිතිවලටද ඉදිරිපත් විය හැක. ඊට අදාළ වලංගු ලියාපදිංචි සහතිකපත්වල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළයුතුවේ.
03. වැව් ඇල වේලි හා කෘෂි ළිං ඉදිකිරීම හා අලුත්වැඩියාව
04. සියලුම වෙල්ඩින් වැඩ හා ඇලුමිනියම් වැඩ
05. ගොඩනැගිලි විදුලි පද්ධති වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියාව
06. ජල නල පද්ධති වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියාව
07. සියලුම වඩු කාර්මික කටයුතු
08. සියලුම විදුලි කාර්මික කටයුතු
09. සියලුම පෙදරේරු වැඩ
10. සියලුම වෙන් කිරීම් (Partition) වැඩ
11. එල්ලෙන සිවිලිම්, තිර රෙදි සහ ටින්ටර්ඩ් වැඩ

භාණ්ඩ (සැපයුම්)

ලිපි ද්‍රව්‍ය හා පොත්

12. සියලුම වර්ගවල ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා
13. පරිගණක ලිපිද්‍රව්‍ය (පරිගණක කඩදාසි, රිබන්, ටෝනර්, කාට්‍රිජ් මාස්ටර් රෝල් සහ තීන්ත, CD,DVD, හා වෙනත්)
14. මුද්‍රිත පොත් සැපයීම

කාර්යාල උපකරණ

15. සියලුම වර්ගවල කාර්යාලීය උපකරණ
16. සියලුම වර්ගවල කාර්යාල විදුලි උපකරණ
17. පරිගණක යන්ත්‍ර,ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, Smart Board, ප්‍රොජෙක්ටර්, UPS එම අමතර කොටස් හා ජාලගත කිරීම් උපාංග
18. රබර් මුද්‍රා, දින මුද්‍රා, බ්ලොක්, බැනර්, පොත් බැඳීම, සහ මුද්‍රණ කටයුතු
19. ලෝහ, ලී සහ ප්ලාස්ටික් නාම පුවරු සහ ඩිජිටල් පුවරු

වාහන අමතර කොටස්

20. සියලුම වර්ගවල මෝටර් රථ අමතර කොටස් සහ උපාංග
21. ටයර්, ටියුබ්, බැටරි, ඇලෝවීල් සහ උපාංග
22. වාහන රිවස් කැමරා, GPS System සපයා සවිකිරීම

ගොඩනැගිලි ද්‍රව්‍ය

23. සියලුම වර්ගවල ගොඩනැගිලි අමුද්‍රව්‍ය (වැලි, පස්, ගඩොල්(මැටි/සිමෙන්ති), ගල් (ABC,චිප්ගල්, ¾ ගල් සහ 6*9) ස , ඉන්ටර්ලොග්
24. සියලුම වර්ගවල හාඩ්වෙයාර් උපකරණ
25. සියලුම වර්ගවල ගොඩනැගිලි විදුලි උපාංග සහ උපකරණ
26. වායු සමීකරණ යන්ත්‍ර සහ එම අමතර කොටස්
27. ජලනල සහ ජලපවාහන උපකරණ
28. ටයිල් සහ නාන කාමර උපකරණ
29. කළුගල් ආශ්‍රිත නිෂ්පාදන හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
30. සියලුම වර්ගයේ දැව වර්ග

කෘෂි උපකරණ, බීජ රෝපණ ද්‍රව්‍ය ,පැල තවාන් සහ ධීවර ආම්පන්න

31. කෘෂිකර්ම කටයුතු සඳහා යන්ත්‍ර (මහටැක්ටර්, ගොයම් කපන යන්ත්‍ර, අත්ටැක්ටර්,රෝපණ බීජ පිරිසිදු කිරීමේ යන්ත්‍ර,..ආදි)
32. කෘෂි යෙදවුම් කටයුතු සඳහා (වතුර මෝටර්, තෙල් ඉසින යන්ත්‍ර, පොලිසැක් යන්ත්‍ර, බිංදු සහ විසුරුම් ජල සම්පාද පද්ධති,Yellow light system, කෘමි ප්‍රතිරෝධී දැල්, විදුලි පඹයා, වායු රයිපල් )
33. කෘෂිකර්මික අගය එකතු කිරීමේ යන්ත්‍ර (සහල් පිටියන්ත්‍ර, රටකජ බීජ වෙන් කිරීමේ යන්ත්‍ර, කුරක්කන් බීජ වෙන් කිරීමේ යන්ත්‍ර, විජලන යන්ත්‍ර ආදී)
34. බීජ හා රෝපණ ද්‍රව්‍ය (බීජ වර්ග හා පැල තවාන්)
35. කෘෂි රසායන සහ පොහොර වර්ග සැපයීම
36. කුකුළු පැටවුන්, වටු කුරුල්ලන් සහ එළුවන් ආදී ජීව සතුන් සැපයීම
37. ඖෂධ පැල හා රෝපණ ද්‍රව්‍ය සැපයීම
38. ධීවර උපකරණ සහ ආම්පන්න (ඔරු, දැල්, ආදී)

වෙනත් භාණ්ඩ හා උපකරණ

39. තොග හා සිල්ලර වෙළඳ භාණ්ඩ (ඇසුරුම් කළ හා නොකළ ආහාර පාන හා වෙනත්)
40. නිල නිවාස සහ සංචාරක නිවාස උපකරණ (පිඟන්, කෝප්ප, හ ගැරුප්පු, ඇලුමිනියම් මෙවලම්, වීදුරු භාණ්ඩ, ඇඳ ඇතිරිලි, කොට්ට උර, කොට්ට ආදී)
41. ක්‍රීඩා භාණ්ඩ සහ සුභ සාධන භාණ්ඩ
42. අත්‍යන්ත්‍ර නිෂ්පාදන උපකරණ (ස්වයං රැකියා උපකරණ)
43. සංගීත උපකරණ (දේශීය /විදේශීය)
44. නිල ඇඳුම්, කාර්යාල බෑග්, කාර්යාලීය ටී ෂර්ට්, සමභාණ්ඩ, සහ වැගි කබා සැපයීම සහ ඇඳුම් මැසීම
45. සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම
46. ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධති සපයා සවිකිරීම
47. කේටරින් උපකරණ
48. රූපලාවන්‍ය උපකරණ

උපදේශන නොවන සේවා

49. පරිගණක යන්ත්‍ර , ඡායා පිටපත් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
50. පරිගණක ජාල පද්ධති, CCTV සවිකිරීම, අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම
51. Video Editing, Graphic design, Boosting (Social Media- Facebook, Youtube)
52. කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව (වානේ අල්මාරි, සෝෆා පුටු, කාර්යාලීය පුටු, විදුලි උපකරණ, MDF කබඩ් ආදී)
53. Smart board, TV ,ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධති අලුත්වැඩියාව සහ නඩත්තු කිරීම
54. අභ්‍යන්තර දුරකථන ජාල හා ශබ්ද විකාශන පද්ධති අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
55. ගිනි නිවන උපකරණ සහ ගිනි අනතුරු ඇඟවීමේ පද්ධති අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
56. වායු සමීකරණ යන්ත්‍ර ශීතකරණ ඇතුළු විදුලි උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තු කිරීම
57. විදුලි උත්පාදන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
58. පවිත්‍රතා සේවා සැපයීම
59. ආරක්ෂක සේවා සැපයීම
60. සියලුම වර්ගවල වාහන අලුත්වැඩියාව හා සේවා කිරීම (වාහන වායු සමීකරණ කිරීම, ටින්කරින් කිරීම, පින්තාරු සහ කුෂන් කිරීම ඇතුළුව)
61. ELV (Extra Low Voltage) පද්ධති අලුත්වැඩියා හා නඩත්තු කිරීම
62. අපද්‍රව්‍ය පිරිපහදු කිරීම් පද්ධති අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම්
63. ජල පොම්ප පද්ධති හා ජලනල පද්ධති අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම්
64. විදුලි වැට නඩත්තු හා සේවා කිරීම
65. නේවාසික පුහුණු වැඩසටහන් පැවැත්වෙන ආයතන
66. තාවකාලික ප්‍රවාහන පහසුකම් (මඟින් සහ භාණ්ඩ)
67. අධිබලැති හා අවබලැති විදුලි පද්ධති අලුත්වැඩියා සහ නඩත්තු කිරීම
68. රෙදිසේදීම, පිරිසිදු කිරීම ආදිය (සංචාරක බංගලා)
69. සූර්ය කෝෂ පද්ධති (Sola Panel System) සැපයීම හා අලුත්වැඩියාව
70. පිරිපහදු කළ ජල බෝතල්, පිසූ ආහාර, කෙටි කෑම හා තේ ආදිය සැපයීම සහ කේටරින් සර්විස්
71. බදුපදනම මත උත්සව අවස්ථා සඳහා උපකරණ සැපයීම (මඩු/පුටු/මේස/කැනපි/පැරාබොලික් හට්/ජංගම වැසිකිළි/ශබ්ද විකාශන යන්ත්‍ර/TV පැනල්/වේදිකා/සැරසිලි/විදුලි බල්බ සහ ෆ්ලැසර් ඇතුළව)
72. ආපණශාලා පවත්වා ගෙන යාම
73. පානීය ජලය, සහ උද්‍යාන පාලන සඳහා ජලය සැපයීම (බවුසර් මඟින්)
74. පරිගණක මෘදුකාංග සැපයීම
75. නාඳුනන මළ සිරුරු මිහිදන් කිරීම